# නාමර් ඵලකය

අයි. එල්. විභාෂණ, ආර්. එම්. යූ. එස්. රාජපක්ෂ, කේ. එම්. යූ. කෞෂල්‍යා සහ
ආර්. එම්. වයි. එම්. රාජපක්ෂ[1]

නාමර් ඵලකය මිසර ප්‍රථම රාජවංශ පාලකයා වූ නාමර් රජු විසින් උතුරු දකුණු රාජධානි එක්සත් කිරීම සංකේතවත් කරන්නකි. මෙය කොළ පැහැති ගල් පතුරක අර්ධ උන්නත ව කැටයම් කරනු ලැබුවකි. මිසර කලාකෘතිවල ඇති රූපාක්ෂර හා සංකේත එකල පැවති සමාජ හා දේශපාලන තත්ත්වය සන්නිවේදනය කිරීම සඳහා භාවිත කළ ආකාරය පිළිබඳ අවබෝධයක් ලබාගැනීම මෙහි අරමුණ වේ. මිසර පුරාවෘත්තවල එන ජනප්‍රවාද හා විශ්වාස මත පදනම් ව අධ්‍යයනය කිරීම මඟින් නාමර් ඵලකයේ සංකේතාර්ථ හඳුනාගත හැකි ය. එහි දෙපස ම කැටයම්වලින් යුක්ත ය. ඉදිරිපස කොටස තීරු තුනකට බෙදා ඇත. ඵලකයේ දෙපස ඉහළින් දැක්වෙන අං සහිත සත්ත්ව රූ හැතෝර් දෙවඟන නිරූපණය කරයි. ඵලකයේ ඉදිරිපස කොටසේ රජු පැළඳ සිටින රක්තාලේපිත ඔටුන්නෙන් පහළ ඊජිප්තුව නිරූපණය කෙරේ. ඵලකයෙහි මධ්‍යයේ ග්‍රීවයන්ගෙන් එකට වෙලී සිටින සුනඛයන් දෙදෙනාගෙන් ඉහළ හා පහළ ඊජිප්තුව එක් වූ ආකාරය අර්ථවත් කෙරේ. ඉදිරිපස මුහුණතේ පහළ කැටයම විජයග්‍රහණ ප්‍රතිමූර්තියකි. එහි බළකොටුව බිඳ දමන ගවයා රජුගේ බලය හා ශක්තිය සංකේතවත් කරයි. ඵලකයෙහි පසුපස දැක්වෙන උකුසු රූපයෙන් හෝරස් දෙවියා නිරූපණය කෙරේ. එහි දැක්වෙන පැපිරස් පත්‍රවලින් පහළ ඊජිප්තුව සංකේතවත් කෙරේ. රජුගේ නාමය දක්වා ඇත්තේ රූපාක්ෂරවලිනි. රජු පැළඳ ඇති ශ්වේත වර්ණ ඔටුන්න ඉහළ ඊජිප්තුව නිරූපණය කරයි. කැටයමේ වම්පස වගුරු බිමක පැපිරස් පඳුරු දක්වා ඇත. මෙහි වගුරු බිමෙන් ඊජිප්තුවේ නයිල් ඩෙල්ටාවේ වගුරු බිම නිරූපණය කරයි. ඵලකයෙහි පසුපස රජු වස්ත්‍ර සහිත ව සහ සතුරා නිර්වස්ත්‍ර ව දැක්වීමෙන් එකල සමාජ තත්ත්වය පැහැදිලි කෙරේ. මිසර කාන්තාවන් රූපාලාවන්‍ය කටයුතුවලදී විලවුන් මිශ්‍ර කිරීම සඳහා භාවිත කළ මෙවැනි ඵලක පසු ව යුද්ධ සිද්ධීන් සහ දේශපාලනික සිද්ධීන් අනුස්මරණ ඵලකවලට පරිවර්තනය විය. නාමර් ඵලකයේ ද සතුන් දෙදෙනාගේ ග්‍රීවයන් අතර වූ වෘත්තාකාර හිස් අවකාශය මඳක් ගැඹුරින් කැටයම් කර තිබීම හේතුවෙන් මෙය ද විලවුන් මිශ්‍ර කිරීම සඳහා භාවිත කරන්නට ඇතැ යි සිතිය හැකි ය. එහෙත් මෙහි ඇති රජුගේ යුද ජයග්‍රහණ නිරූපණය වන සංකේත සහ රූපාක්ෂර හේතුවෙන් මෙකී ඵලකය යුද්ධ අනුස්මරණ ඵලකයක් ලෙස හඳුනාගත හැකි ය.

**ප්‍රමුඛ පද**: නාමර් ඵලකය, සමාජ දේශපාලන තත්ත්වය, රූපාක්ෂර, සංකේතාර්ථ, පුරාවෘත්ත

[1] ලලිත කලා අධ්‍යයනාංශය